# කාවන්තිස්ස රජුගේ කාර්යය සාඵල්‍යය කෙරෙහි අර්ථ ශාස්ත්‍රයේ ආභාසය බලපා තිබේද?

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**පී.පී.ආර්.ජේ.එන්.හර්ෂණී** [1]

**ධම්මිකා කුමාරි මනතුංග** [2]

## සංක්ෂේපය

කාවන්තිස්ස රජු ශ්‍රී ලංකා ඉතිහාසයේ වැදගත් පාලකයෙකු ලෙස හැඳින්විය හැකිය. ක්‍රි.පූ දෙවන සියවස වන විට ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය තුළ රජරට රාජධානියෙන් බැහැරව ස්වාධීනව ප්‍රාදේශීය වශයෙන් හැඩගැසුණු රාජ්‍යයන් කීපයක් දක්නට ලැබේ. මින් රෝහණය හා කැලණිය වනාහි ප්‍රධාන ප්‍රාදේශීය රාජධානි වශයෙන් හඳුනාගත හැකිය. වංසකතා සාධකවලට අනුව දේවානම්පියතිස්ස රජුගේ සොහොයුරෙකු වූ උපරාජ මහානාගගෙන් ඇරඹෙන මාගම කේන්ද්‍රකරගත් රෝහණ රාජධානියෙහි සිව්වැනි පාලකයා වන්නේ කාවන්තිස්ස රජුය. මහානාග, යටාලතිස්ස සහ ගෝඨාභය යන පාලකයන්ගේ කාර්යයන්හි ආභාසය උකහාගනිමින් අර්ථ ශාස්ත්‍රයේ න්‍යායන් කෙරෙහි ද අවධානය යොමු කරන ලද, සෑම අංශයකින්ම දියුණුවක් අත්පත් කරගත් පාලකයෙක් වශයෙන් කාවන්තිස්ස රජතුමා හඳුනාගත හැකිය. අර්ථ ශාස්ත්‍රය ගත් කල  එය වූ කලී පුරාණ භාරතීය රාජ්‍ය පාලන මූලධර්ම අන්තර්ගත වන නීති ශාස්ත්‍ර ග්‍රන්ථයක් ලෙස සලකනු ලැබේ. අර්ථ ශාස්ත්‍රයෙහි අවධානයට ලක් වූ ප්‍රධාන කරුණු අතර පාලකයාගේ පරිපාලන කටයුතු සංවිධානය, නිලධරයන් පිළිබඳව කටයුතු කිරීම, රටෙහි ආර්ථිකය සකස් කිරීම, යුද කටයුතු, චරපුරුෂ සේවය, බාහිර හා අභ්‍යන්තර උවදුරුවලින් රට ආරක්ෂා කරගැනීම ආදී වේ.

කාවන්තිස්ස රජුගේ කාර්යය සාපල්‍යය පිළිබඳව විමසා බැලීමේ දී පෙරදිග දේශපාලන චින්තනය පිළිඹිබු වන කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ න්‍යායන්හි අභාසය ලබා තිබුණේ ද යන්න අනාවරණය කරගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. මෙහිදී ක්‍රමවේදය වශයෙන්, පර්යේෂණ මාතෘකාවට අදාළ ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රයයන් සහ ද්විතියික සාහිත්‍ය මූලාශ්‍රයයන් ඔස්සේ කරුණු ඒකරාශී කරනු ලැබිණි. මෙතුමා විසින් දේශපාලන කර්තව්‍යයෙහිලා සිය රාජධානිය ආරක්ෂා කරගනිමින්, එහි සීමා පුළුල් කරගනිමින්, ද්‍රවිඩ ආධිපත්‍යය මුලිනුපුටා දැමීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරගනිමින් මෙන්ම ආගමික හා ආර්ථික යන අංශයන්හි ද දේශපාලනික කාර්යයන්හි අනුගත කරගනිමින් අර්ථ ශාස්ත්‍රානුකූලව සියල්ල සංවිධානය කිරීම කෙරෙහි අවධානය යොමු කළ බව ගම්‍යමාන වේ. ලක්දිව එක්සේසත් කළ වීරෝදාර පාලකයෙකු වශයෙන් දුටුගැමුණු රජුට විශේෂිත ස්ථානයක් හිමි වුවද, ඔහුගේ පියා වන කාවන්තිස්ස රජුගේ චරිතය ඒ ඔස්සේ යටපත් වී ඇති බව පෙනීයයි. නමුත් දුටුගැමුණු රජුට ලක්දිව එක්සේසත් කිරීමට පදනම, අර්ථ ශාස්ත්‍රයේ ආභාසය ඔස්සේ කාවන්තිස්ස රජු විසින් සකස් කෙරුණු බව මූලාශ්‍රයවලින් පෙන්නුම් කෙරේ. අර්ථ ශාස්ත්‍රයේ ඇතැම් න්‍යායයන් මෙතුමා සිය කටයුතු කෙරෙහි යොදා ගනිමින් ඉන් සාර්ථක ප්‍රතිඵල ලබාගත් බුද්ධිමත් පාලකයෙකු වන බව පැහැදිලි වේ. ඒ අනුව කාවන්තිස්ස රජුගේ කාර්යය සාඵල්‍යය කෙරෙහි අර්ථශාස්ත්‍රයේ ආභාසය බලපෑ බව අනාවරණය කරගත හැකි විය.

ප්‍රමුඛ පද : රෝහණ රාජධානිය, කාවන්තිස්ස රජතුමා, පාලන සංවිධානය, අර්ථශාස්ත්‍රය

*1 ඉතිහාසය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*